# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.01 පැය 2115 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 06/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ව්‍යාජ ලෙස එකලස් කරන ලද වාහන ජාවාරමක් සිදුකළ සැකකරුවෙකු අත්අඩංගුවට - නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය.**

2023 වර්ෂයේදී පානදුර වලාන දූෂණ මර්ධන ප්‍රහාර ඒකකයේ අධ්‍යක්ෂවරයාට ලද තොරතුරක් මත ව්‍යාජ අංක තහඩු සහ වාහන බලපත්‍ර භාවිතා කර පරිහරණය කරනු ලබන ජීප් රථ 03 ක් සමඟ පුද්ගලයෙකු කඩවත ප්‍රදේශයේදී අත්අඩංගුවට ගන්නා ලදී. අත්අඩංගුවට ගත් සැකකරු මහර ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලද අතර, එහි වැඩිදුර විමර්ශන වාර්තා පොලිස්පතිතුමා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ඉදිරි විමර්ශන සිදුකිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය වෙත යොමු කර ඇත.

එම කොට්ඨාසය මඟින් සිදුකළ දීර්ඝ විමර්ශනයේදී අනාවරණය කරගත් තොරතුරු මත මාතලේ ප්‍රදේශයේ පුද්ගලයෙකු සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කරගත් අතර එම පුද්ගලයාගේ නිවසේ ගාල් කර තිබූ වාහන අතරින් වාහන 08 ක් පිළිබඳව කිසිදු ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වීම මත එම සැකකරු වාහන 08 සමඟ 2024.12.31 වන දින අත්අඩංගුවට ගැනීමට විමර්ශන නිලධාරින් කටයුතු කර ඇත.

සැකකරු විසින් රජයට අයවිය යුතු බදු මුදල් වංචා කරමින් කූඨ ලේඛන සකස් කර වාහන එකලස් කර විකිණීමේ ජාවාරමක් සිදුකර ඇති බවටත්, ඔහු විසින් වාහනවල වැසි කොටස් කපා ඉවත් කර වෙනත් වැසි බද්ධ කරමින් එම වාහන වල විවිධ වෙනස් කම් සිදුකරමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් ධාවනයෙන් ඉවත් කරන ලද ගර්හිත වාහන එකලස් කර එම රථ සාදා විකිණීමට කටයුතු කර ඇති බවට විමර්ශන වලදී අනාවරණය වී ඇත.

තවද මෙම සැකකරු විසින් එකලස් කරන ලද වාහනයක් පිළියන්දල ප්‍රදේශයේ පුද්ගලයෙකුට විකුණා තිබියදී විමර්ශන නිලධාරින් විසින් සොයාගෙන ඇති අතර, මොහු විසින් මේ ආකාරයෙන් වැසි කොටස් කපා බද්ධ කරන ලද වාහන රැසක් සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කරගෙන ගැනීම සඳහා නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය මඟින් තවදුරටත් විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**